# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2182/32 - 2020 ජූලි මස 01 වැනි බදාදා - 2020.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග

පනතේ විධිවිධාන යටතේ 2020 අප්‍රේල් මස 8 දිනැති අංක 2170/4 *අති විශේෂ ගැසට් නිවේදනයේ* ප්‍රකාශයට පත් කරන ලද **"විශේෂ තැන්පතු ගිණුම්"** පිළිබඳ නියෝගවලට අමතරව,

1. විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට සුදුසුකම්ලත් සහ 2020 ජනවාරි මස 01 වැනි දින හෝ එදිනට පසුව විදේශයන්හි සිට ශ්‍රී ලංකාවට පැමිණ ඇති ඕනෑම පුද්ගලයෙකුට, **2020 අප්‍රේල් මස 08 වැනි දින සිට මාස 06ක් ඉකුත්වීමට පෙර**, එවැනි පුද්ගලයන් විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් සහ පහත පරිදි ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමයවලින්, ශ්‍රී ලංකාවේ ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමග විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබයි.

(අ) 2017 නොවැම්බර් මස 17 දිනැති අංක 2045/56 දරන *අති විශේෂ ගැසට් නිවේදනයෙහි* ප්‍රකාශයට පත් කර ඇති පනතෙහි 8 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග (සහ ඒ සඳහා වන ඕනෑම සංශෝධනයක්) ප්‍රකාරව, පැමිණෙන තොටුපොළෙහිදී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත.

(ආ) එවැනි විදේශ විනිමය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් 15,000ක් හෝ ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක් හෝ අඩු ප්‍රමාණයක් වන අවස්ථාවකදී විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට නියමිත බලයලත් වෙළෙන්දා වෙත සුදුසු ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම මත.

2. මෙම පනතේ 8 වන වගන්තිය යටතේ *ගැසට් නිවේදනයේ* ප්‍රකාශයට පත්කර ඇති, අමාත්‍යවරයා විසින් පනවන ලද නියමයෙහි සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත්ව සහ එවැනි සීමාවන් දක්වා, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික ඕනෑම තැනැත්තෙක් සන්තකයේ පවතින විදේශ ව්‍යවහාර මුදල්වලින්, බලයලත් වෙළෙන්දා හට අරමුදල්වල මූලාශ්‍රය පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, සන්තකයේ ඇති එවැනි විදේශ ව්‍යවහාර මුදල්වලින් **2020 අප්‍රේල් මස 08 වැනි දින සිට මාස 6ක් ඉකුත්වීමට පෙර** ඕනෑම බලයලත් වෙළෙන්දෙකු සමග විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබයි.

**මහින්ද රාජපක්ෂ**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

07 - 436